# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2323/18 – 2023 මාර්තු මස 14 වැනි අඟහරුවාදා – 2023.03.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 551 කටුබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුබැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/MRT/2017/701 හා 2020.08.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – ගම්මැද්ද කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0632 ක් පමණ**

උතුරට: විමලා විජේතුංග හිමිකම් කියන බණ්ඩාරනායක මාවතේ වරි. අංක 77 දරන ගම්මැද්ද කුඹුර ඉඩම සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ගම්මැද්ද කුඹුර ඉඩම; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ගම්මැද්ද කුඹුර ඉඩම සහ පිට ඇළ; දකුණට: පිට ඇළ සහ බණ්ඩාරනායක මාවත; බටහිරට: විමලා විජේතුංග හිමිකම් කියන බණ්ඩාරනායක මාවතේ වරි. අංක 77 දරන ගම්මැද්ද කුඹුර ඉඩම.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/WS/185.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2022 නොවැම්බර් මස 30 වැනි දින.

EOG 03 - 0172




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*